## පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමාගේ විශේෂ නිවේදනය

## පාර්ලිමේන්තුව රැස්වීම පිණිස කරන කැඳවීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 (4) (i) වැනි ව්‍යවස්ථාවෙන් අතිගරු ජනාධිපතිතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර හදිසි අවස්ථා තත්ත්වයක් ප්‍රකාශයට පත් කරන ලද බව පාර්ලිමේන්තුවට දන්වා සිටීමට හා ඒ සඳහා පාර්ලිමේන්තුවේ අනුමතිය ලබා ගැනීම සඳහා දැනට විසුරුවා හැර ඇති හයවැනි පාර්ලිමේන්තුව 2010 මාර්තු මස 09 වැනි අඟහරුවාද පූ.භා. 9.30 ට රැස්වීම පිණිස කැඳවා ඇති බව දන්වා සිටියි.

මේ අනුව, මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනාව (හදිසි නීතිය) සම්මත කිරීම පිණිස 2010 මාර්තු මස 09 වැනි අඟහරුවාද පූ.භා. 9.30 ට පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු රැස්වීමට පැමිණ සහභාගී වන මෙන් හයවැනි පාර්ලිමේන්තුවේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටියි.

වැඩි විස්තර අවශ්‍ය වන්නේ නම් පහත සඳහන් දුරකථන අංක මගින් පාර්ලිමේන්තුවේ සභාලේඛන කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂවරුන් (පරිපාලන) එච්. ඊ. ජනකාන්ත සිල්වා සහ එස්. ඩී. ශාන්ත සැම් යන මහත්වරුන් අමතන ලෙස ද පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමා තවදුරටත් ඉල්ලා සිටියි:-

011 – 2777549
011 – 2777273
011 – 2777304
011 – 2777367